# 9 ශ්‍රේණිය - දෙවන වාරය - 4 වන ඒකකය

## අපරදිග සංගීත භාණ්ඩ වර්ගීකරණය

නිපුණතාව : සංගීත නිර්මාණ කාර්යයේ අත්හදා බැලීම් කරයි.

නිපුණතා මට්ටම : අපරදිග තූර්යවාදක භාණ්ඩ වර්ගීකරණය .


ක්‍රියාකාරකම : අපි මුලින්ම පාසල් තූර්ය වාදක කණ්ඩායමක් නරඹමු.

මේ ලින්ක් එක ක්ලික් කරන්න
https://www.youtube.com/watch?v=JrrGEr79i30

ප්‍රධාන වශයෙන් අපරදිග තූර්ය වාදක භාණ්ඩ කොටස් තුනකට බෙදේ.

- තන්ත්‍රිය (String )
- සුෂිර (Wind)
- සමාඝාත (Percussion)

දැන් අපි එය දළ සටහනකට අනුව අනු කොටස් වලට බෙදෙන හැටි අධ්‍යයනය කරමු.





සැකසුම - එම් අජන්තා ඉන්දිකා කරුණාතිලක
ර/නිවි/පලාවෙල ශ්‍රී රත්නාකර මහ විද්‍යාලය

ඉහත වර්ගීකරණයට අනුව පහත දැක්වෙන භාණ්ඩ එක් එක් කොටසට බෙදා දක්වන්න

| | | | |
|---|---|---|---|
| Violin | Viola | Cello | Double Bass |
| Guitar | Mandolin | | Banjo Mandolin |
| Saxphone | Clarinet | Trombone | Oboe |
| Eupohinium | Tuba | Trumpet | Cornet |
| Feench Horn | Corangali | | |
| GlockenSpiel | Vibrophone | | Xylophone |
| Bass Drum | Tenor Drum | | Side Drum |
| Timpony Drum | | | |

දැන් අපි කළ ක්‍රියාකාරකම නිවරදි දැයි බලමු.





සැකසුම - *එම් අජන්තා ඉන්දිකා කරුණාතිලක*
*ර/නිවි/පලාවෙල ශ්‍රී රත්නාකර මහ විද්‍යාලය*

# <u>පාසල් පද්ධතිය තුළ භාවිත වන අපරදිග සංගීත භාණ්ඩ</u>

පෙරදිග සංගීතය ගායනයට ප්‍රධාන තැනක් ඇති සංගීතයක් වුවත්, අපරදිග සංගීතය වාදනයට ප්‍රධාන තැනක් ගත් සංගීත ක්‍රමයක් බව විද්වත්හු පිළිගනිති. එසේ ම බටහිර සංගීතයේ හඬතල ගණනාවක් භාවිත වේ. මෙසේ හඬතල කිහිපයක් භාවිත කිරීමට නම් ඒ ඒ හඬතලයට ගැළපෙන සංගීත භාණ්ඩ ද නිර්මාණය වී තිබිය යුතු ය. සැබවින් ම පහත් ම හඬතලයේ සිට ඉහළම හඬතලය දක්වා විහිදුණු සංගීත භාණ්ඩ විශාල ප්‍රමාණයක් බටහිර සංගීතයේ නිර්මාණය වී ඇත. එම බටහිර සංගීත භාණ්ඩ අතරින් පාසල් පද්ධතියේ භාවිත වන භාණ්ඩ රාශියක් පාසල් තූර්යවාදක කණ්ඩායම්වල භාවිත වේ. පෙරදිග සංගීතය හැදෑරුව ද සිසුන් එම භාණ්ඩ හඳුනාගැනීම ඵලදායි වේ.

ඉදිරියේ  දක්වෙන්නේ පාසල් පද්ධතියේ භාවිත වන සංගීත භාණ්ඩ කිහිපයක රූප සටහන් ය. මේවායේ වර්ණ පින්තූර සපයා ගත හැකි නම් වඩාත් වාසි දායක ය. ඒ අතරින් කිහිපයක් හඳුනාගනිමු. බටහිර තූර්ය වාදක කණ්ඩායමක වැඩි වශයෙන් ඇත්තේ පිඹීමේ භාණ්ඩ ය. ඒවා ප්‍රමාණයෙන් විවිධ වුවත් හැඩයෙන් සහ වාදන තත්ත්වයෙන් බොහෝ දුරට එක සමාන ය. පහත දක්වෙන්නේ තූර්යවාදක කණ්ඩායම් තුළ ජනප්‍රියතම භාණ්ඩයක රූපසටහනකි. ඇරෙන වැසෙන වැල් තුනකින් සියලු ම ස්වර වාදනය කරනු ලැබේ. එක ම ස්ථානයකින් ස්වර තුනක් පමණ නිකුත් වේ. එසේ කරනුයේ මුවට තබා පිඹීමේ දී වේගය අඩු වැඩි කරමින් ය. එහි කොටස් නම් කර ඇත. එම කොටස් නාම අනෙකුත් ඒ හා සමාන භාණ්ඩවලට ද අදාළ ය.  ස්වර නිකුත් වන ආකාරය ද මෙවැනි භාණ්ඩවල එක සමාන ය.




ට්‍රම්පට් එකේ හඬට වඩා පහළ හඬක් නිකුත් වන භාණ්ඩය ත්‍රොම්බෝන් නම් වේ. එම භාණ්ඩයේ ඇරෙන වැසෙන වැල් නොමැත. ඒ වෙනුවට ස්ලයිඩ් ( Slide ) නම් කොටස ඉදිරියට ගෙන යෑම හා පසුපසට ගෙන ඒම මඟින් ස්වර නිකුත් කරනු ලැබේ. ට්‍රම්පට් භාණ්ඩයේ මුවින් පිඹීමේ ක්‍රමය මෙම භාණ්ඩයට ද අදාළ වේ.




සැකසුම - *එම් අජන්තා ඉන්දිකා කරුණාතිලක*
*ර/නිවි/පලාවෙල ශ්‍රී රත්නාකර මහ විද්‍යාලය*

මීළඟට පහත් හඬතලයක ස්වර නිකුත් වන භාණ්ඩ කිහිපයක් ඇත. ඒවායේ හඬ Bass ඉතා පහළ ය. පහත රූප සටහන්වලින් එම භාණ්ඩ හඳුනාගන්න. මේ අතරින් බැරිටෝන් සහ ඉයුෆෝනියම් නම් භාණ්ඩ යුගලය වෙන් කොට හඳුනා ගැනීමට නොහැකි තරම් සමාන ය. මේ නිසා බැරිටෝන් නම් භාණ්ඩය ඉයුෆෝනියම් වශයෙන් ද, ඉයුෆෝනියම් භාණ්ඩය බැරිටෝන් වශයෙන් ද නම් කරන අවස්ථා ඇත. භාණ්ඩ අලෙවි කරන කඩ සාප්පුවල ද මෙසේ මෙම භාණ්ඩ මාරු කර අලෙවි කරනු ලැබේ. ඉයුෆෝන් එකකට වඩා බැරිටෝන් භාණ්ඩය සුළු වශයෙන් විශාල ය. මෙම භාණ්ඩ ධ්වන ගුණය එක සමාන ය. පහත දැක්වෙන රූප සටහන් දෙකින් ඒවා වෙන් කර හඳුනා ගැනීමට උත්සාහ ගන්න.







මෙම භාණ්ඩ කුලකයේ පහළ ම හඬතලයේ ස්වර නිකුත් කරනුයේ සෝසෆොන් සහ ටියුබා යන භාණ්ඩ වලින් ය. එම භාණ්ඩ පහත රූප සටහන්වලින් හඳුනා ගන්න.

සැකසුම - එම් අජන්තා ඉන්දිකා කරුණාතිලක
ර/නිව්/පලාවෙල ශ්‍රී රත්නාකර මහ විද්‍යාලය







මේ දක්වා අධ්‍යයනය කළේ එක ම කුලකයක සංගීත භාණ්ඩ කිහිපයකි. මේවායේ නාදය නිකුත් කරන ආකාරය සහ පිඹීමේ ක්‍රමය සහ පිත්තල ලෝහයෙන් නිර්මාණය වීම යන කාරණ එක සමානය. එබැවින් මෙම භාණ්ඩ Brass නම් භාණ්ඩ වර්ගයට අයත් ය. පහත රූප සටහනින් භාණ්ඩ වර්ග කිහිපයක වාදන ඉරියවු දක්වේ.



සැකසුම - *එම් අජන්තා ඉන්දිකා කරුණාතිලක*
*ර/නිවි/පලාවෙල ශ්‍රී රත්නාකර මහ විද්‍යාලය*

**මීළඟට තවත් කුලකයක භාණ්ඩ කිහිපයක් හඳුනා ගනිමු.**

මෙම භාණ්ඩ සියල්ල ම පාහේ මුල දී සකස් කර ඇත්තේ ලීයෙනි. එබැවින් ඒවා Wood Wind නම් වර්ගයට අයත් ය. පිඹීමේ ස්ථානය ඉපියාවකින් යුක්ත ය. සමහර භාණ්ඩවල ඉපියා දෙකක් එකට ඇත. තවත් සමහර භාණ්ඩවල ඇත්තේ එක් ඉපියාවකි. තවත් සමහර භාණ්ඩවල ඉපියාවක් ඇත්තේ ම නැත. පහත දැක්වෙන රූප සටහන් මඟින් ඒවා වෙන් කර හඳුනාගන්න. සැක්ස්ෆෝන් නම් භාණ්ඩය ශ්‍රී ලංකාවේ තුළ ජනප්‍රිය භාණ්ඩයකි. සැක්සෆෝන් හඬතල අනුව නිර්මාණය වී ඇත. සොප්රානෝ සැක්ස්, ඇල්ටෝ සැක්ස්, ටෙනර් සැක්ස් සහ බැරිටෝන් සැක්ස් නමින් හඬතල හතරට ගැළපෙන ලෙස නිර්මාණය වී ඇත. ඒවා ප්‍රමාණයෙන් වෙනස් ය. හඬින් ද වෙනස් ය. වාදනය කරන ස්වරූපය එක සමාන ය. මීට අමතර ව එම රූප සටහනේ ක්ලැරිනට් නම් භාණ්ඩය ද දැක්වේ. එය ද සොප්රානෝ ක්ලැරිනට් සහ බේස් ක්ලැරිනට් වශයෙන් ප්‍රමාණයෙන් වෙනස් ව දක්නට ඇත. බටහිර බටනළාව ෆ්ලූට් නමින් හැඳින්වේ. ෆ්ලූට් වර්ග කිහිපයක් දක්නට ඇත. ජනප්‍රිය ෆ්ලූට් විශේෂය කොන්සර්ට් ෆ්ලූට් නම් වේ. එය සුසර කර ඇත්තේ කොන්සර්ට් සී නම් ස්වරයට ය. කුඩා ම නළාව පිකලෝ නමින් හැඳින්වේ. එහි ඇත්තේ ඉහළ ස්වර පරාසයකි. මේ සියල්ල වුඩ් වින්ඩ් නම් භාණ්ඩ වර්ගයට අයත් ය.




සැකසුම - *එම් අජන්තා ඉන්දිකා කරුණාතිලක*
*ර/නිවි/පලාවෙල ශ්‍රී රත්නාකර මහ විද්‍යාලය*

වුඩ්වින්ඩ් වර්ගයට අයත් වන තවත් විශේෂ භාණ්ඩයක් ශ්‍රී ලංකාවේ පාසල් පද්ධතියේ භාවිත වේ. අපේ රටේ සාම්ප්‍රදායික භාණ්ඩයක් වන හොරණෑවේ හඬට බෙහෙවින් සමාන හඬක් ඇති මෙම බටහිර භාණ්ඩය නම් කරන්නේ ඕබෝ (Oboe ) නමින් ය. එහි වාදනය කරන ස්ථානයේ ඉපියා දෙකක් ඇත. එබැවින් ඩබල් රීඩ් සංගීත භාණ්ඩයක් වේ. ක්ලැරිනට්වල සහ සැක්සෆෝන්වල ඇත්තේ තනි ඉපියාවකි. එබැවින් ඒවා සිංගල් රීඩ් භාණ්ඩ වේ. ඕබෝ නම් සංගීත භාණ්ඩයේ පැරණිතම වාද්‍ය කොටසක් ශ්‍රී ලංකා ගුවන් විදුලියේ ප්‍රවෘත්ති විකාශයට පෙර වාදනය කරනු අසන්නට ඇත. හින්දුස්ථානී රාගධාරී සංගීතයට අයත් වාද්‍ය කොටස් ඉතා මිහිරි අයුරින් ඕබෝවෙන් වාදනය කරනු අන්තර්ජාලයේ අසන්නට ඇත. අපේ රටේ ගජගා වන්නමේ තනුව ඕබෝවකින් වාදනය කරන්නේ නම් උඩරට සම්ප්‍රදායයට ගැළපෙනු නොඅනුමාන ය.




මීළඟට පාසල් තූර්ය වාදක කණ්ඩායමක භාවිත වන බටහිර අවනද්ධ භාණ්ඩ කිහිපයක් හඳුනා ගනිමු. අවනද්ධ වාද්‍ය භාණ්ඩ සහ ඝන වාද්‍ය භාණ්ඩ යන පෙරදිග වර්ග දෙක එකට එක් වී බටහිර වර්ගීකරණයේ දී එකට ගෙන සමාඝාත භාණ්ඩ (Percussion) නමින් වර්ග කෙරේ. පහත දැක්වෙනුයේ සමාඝාත නැතහොත් පර්කසන් භාණ්ඩ වර්ගයට අයත් භාණ්ඩ කිහිපයක නම් වට්ටෝරුවකි.
මේ වට්ටෝරුවෙහි බෙර වර්ගත් තැළීමෙන් නාදය උපදවන වෙනත් ස්වර වාද්‍ය භාණ්ඩත් එකට ඇත.

මීළඟට පාසල් තූර්ය වාදක කණ්ඩායමක භාවිත වන බටහිර අවනද්ධ භාණ්ඩ කිහිපයක් හඳුනා ගනිමු. අවනද්ධ වාද්‍ය භාණ්ඩ සහ ඝන වාද්‍ය භාණ්ඩ යන පෙරදිග වර්ග දෙක එකට එක් වී බටහිර වර්ගීකරණයේ දී එකට ගෙන සමාඝාත භාණ්ඩ (Percussion) නමින් වර්ග කෙරේ. පහත දැක්වෙනුයේ සමාඝාත නැතහොත් පර්කසන් භාණ්ඩ වර්ගයට අයත් භාණ්ඩ කිහිපයක නම් වට්ටෝරුවකි.
මේ වට්ටෝරුවෙහි බෙර වර්ගත් තැළීමෙන් නාදය උපදවන වෙනත් ස්වර වාද්‍ය භාණ්ඩත් එකට ඇත.

1. බේස්ඩ්‍රම්
2 සයිඩ් ඩ්‍රම් හෙවත් ස්නෙයාර් ඩ්‍රම්.
3. ටෙනර් ඩ්‍රම්.
4. සිම්බල්
5. ග්ලොකන් ස්පීල්
6. සයිලෆොන්
7. වයිබ්‍රෆොන්

මෙම භාණ්ඩවල රූප සටහන් කිහිපයක් අධ්‍යයනය කරමු.

GlockenSpiel (ජල තරංගයේ හඬට සමාන හඬක් මින් නිකුත් වේ)



සැකසුම - එම් අජන්තා ඉන්දිකා කරුණාතිලක
ර/නිවි/පලාවෙල ශ්‍රී රත්නාකර මහ විද්‍යාලය

## VibroPhone වයිබ්‍රෆෝන්.

මෙම භාණ්ඩයේ එක් පතුරකට තට්ටු කළ පසු නිකුත් වන ස්වරය නැවත නැවත දෝංකාර දෙමින් ඇසෙන අයුරින් එක් එක් ස්වරයට වෙන වෙන ම සුසර කරන ලද නළ සවි කර ඇත.



## Bass Drum




## Side Drum




## Tenor Drum




පසුවැඩ- අපරදිග සංගීත භාණ්ඩවල පින්තූර රැස්කොට ඉහත වර්ගීකරණයට අනුව පොත් පිංචක් සකසන්න.